යෝජනා කැඳවීම (RFP) සඳහා ආරාධනයයි

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (DPMM)

ආසියානු සංවර්ධන බැංකුව (ADB) මූල්‍යකරණය කරන ලද ප්‍රතිඵලපාදක ණය දීමේ වැඩසටහන වන "විශ්වීය සෞඛ්‍ය ආවරණය සඳහා ඒකාබද්ධ සෞඛ්‍ය සේවාව ශක්තිමත් කිරීම" යටතේ ණය මුදාහැරීම සම්බන්ධ දර්ශක (DLI) සාක්ෂාත් කර ගැනීම ස්වාධීනව සත්‍යාපනය කිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීම

RFP අංකය: DPMM/RFP/2026/01

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ උපදේශන ප්‍රසම්පාදන කමිටුව (CPCM), ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව (මෙහි "සේවාලාභියා" ලෙස හඳුන්වනු ලැබේ) වෙනුවෙන් ඉහත සඳහන් උපදේශන සේවා සැපයීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස ආරාධනා කරයි.

උපදේශන සේවාවේ විෂය පථය

ණය මුදාහැරීම සම්බන්ධ දර්ශක (DLI) සත්‍යාපන ක්‍රියාවලිය සැලසුම් කිරීම, සත්‍යාපන ප්‍රොටෝකෝල අනුව අදාළ දර්ශකවල දත්ත ගුණාත්මකභාවය විගණනය කරමින් එම සත්‍යාපන ක්‍රියාවලිය සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සහ මූදල් මූදාහැරීම පිළිබඳ තීරණ ගැනීමට ප්‍රමාණවත්,සවිස්තරාත්මක හා ගුණාත්මක සත්‍යාපන වාර්තා නියමිත වේලාවට සකස් කිරීම සඳහා DPMM වෙත තාක්ෂණික සහාය සැපයීමට ආයතනයක් ප්‍රසම්පාදනය කිරීමට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

එම ආයතනය මගින්, ලේඛන පරීක්ෂා කිරීම සහ ක්ෂේත්‍ර සංචාර ඇසුරින් ප්‍රතිඵල සත්‍යාපනය සිදු කිරීම අපේක්ෂා කරයි . (මෙය සාමාන්‍යයෙන් 2027, 2028, 2029 සහ 2030 වර්ෂවල සෑම වසරකම ජනවාරි 15 සිට මාර්තු 31 දක්වා කාලය තුළ වසරකට වරක් සිදු කෙරේ). 2027 සිට 2030 දක්වා සෑම වසරකම මාර්තු 31 වන දිනට පෙර DPMM වෙත වාර්ෂික ප්‍රතිඵල සත්‍යාපන වාර්තා ඉදිරිපත් කළ යුතුය. සත්‍යාපනයේදී ලේඛන පරීක්ෂා කිරීම සහ පළාත් 9ම සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතන වෙත ක්ෂේත්‍ර සංචාර සිදු කිරීමද ඇතුළත් වේ. සත්‍යාපන කෙටුම්පත් වාර්තාව DPMM වෙත සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු අතර, ඉන් අනතුරුව උපදේශන ආයතනය නියමිත කාලසීමාව තුළ වාර්තාව අවසන් කර DPMM වෙත භාර දිය යුතුය.

උනන්දුවක් දක්වන උපදේශන ආයතන, මෙම කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය අදාළ සුදුසුකම්, මේ හා සමාන කාර්යයන්හි පළපුරුද්ද සහ ප්‍රමාණවත් හැකියාව හා සම්පත් තමන් සතු බව තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

උපදේශන ආයතන පහත අවම සුදුසුකම් සපුරාලිය යුතුය:

- සමාගම් රෙජිස්ට්‍රාර් / ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිකුත් කළ, උපදේශන ආයතනයක් ලෙස ලියාපදිංචි වූ බවට වලංගු ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.
- ව්‍යාපෘති සත්‍යාපන ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද තිබිය යුතුය.
- රජයේ/රාජ්‍ය සතු ව්‍යවසායන් හෝ වෙනත් ආයතන සම්බන්ධ සමාන ව්‍යාපෘති සත්‍යාපන කටයුතු සිදු කළ බවට ඔප්පු කළ හැකි පළපුරුද්ද තිබිය යුතුය.
- පසුගිය වසර තුන (3) තුළ යහපත් මූල්‍ය තත්ත්වයක් සහ ධනාත්මක ශුද්ධ වත්කම් තිබිය යුතුය.

උපදේශන ආයතනය තෝරාගනු ලබන්නේ උපදේශන ප්‍රසම්පාදන මාර්ගෝපදේශය - 2007 හි සඳහන් ගුණාත්මක භාවය සහ පිරිවැය මත පදනම් වූ තේරීම් ක්‍රමය (QCBS) අනුවය.

ඉහත සුදුසුකම් සපුරාලන ආයතනවලට, මූදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කාර්ය පරිශීලන කොන්දේසි (TOR) ඇතුළත් යෝජනා ඉල්ලීමේ ලේඛනය (RFP) ලබාගත හැකිය. ඒ සඳහා ආපසු නොගෙවන රු. 5,000.00 ක මුදලක් මුදලින් ගෙවිය යුතුය. එම ලේඛන 2026.11.01 සිට 2026.11.30 දක්වා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය.

අයදුම්කරුවන්ට අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ (https://www.treasury.gov.lk) කාර්ය පරිශීලන කොන්දේසි (TOR) ඇතුළත් යෝජනා ඉල්ලීමේ ලේඛනය (RFP) ඉංග්‍රීසි භාෂාවෙන් නිරීක්ෂනය කළ හැකිය.වෙබ් අඩවියේ පවතින ලේඛන පරීක්ෂා කිරීම සඳහා පමණක් ලබා දී ඇත.

අයදුම්කරුවන් තාක්ෂණික යෝජනාව සහ මූල්‍ය යෝජනාව වෙන වෙනම මුද්‍රා තැබූ ලියුම් කවරවල බහා, එම කවර දෙකම එක් බාහිර කවරයක දමා ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දිය යුතුය. බාහිර කවරයේ ඉහළ වම් කෙළවරේ පහත කාර්යයේ නම සඳහන් කළ යුතුය: ‘‘සත්‍යාපනය සඳහා උපදේශන ආයතනයක් තෝරා ගැනීම’’.

මෙම කාර්යයේ ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 56.0 කි.

ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දෙන යෝජනා **2026** නොවැම්බර් **30** දින ප.ව. **2.00** ට හෝ ඊට පෙර, කොළඹ 01, මහලේකම් කාර්යාලය, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ තුන්වන මහලේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

යෝජනා (RFP) භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ඕනෑම අයදුම්කරුවෙකුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී විය හැකිය.

පූර්ව යෝජනා රැස්වීම (Pre Proposal Meeting), 2026 නොවැම්බර් 06 වන දින පෙ.ව. 11.30 ට, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ (DPMM) කාමර අංක 328හිදී පැවැත්වේ.

පැහැදිලි කිරීම් වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අමතා ලබාගත හැක . දුරකථන: +94 011-2034412, විද්‍යුත් තැපෑල:Peris.dacd@pmmd.treasury.gov.lk

ප්‍රමාද වී ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම යෝජනාවක් හෝ සියලුම යෝජනා පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුවට අයිතිය ඇත.

සභාපති
අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව
ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ලේකම් කාර්යාලය
කොළඹ – 01, ශ්‍රී ලංකාව
01.11.2026